# ① ව්‍යවසායකත්වය - පිළිතුරු

(1)

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | ✓ | 2. | ✗ | 3. | ✓ |
| 4. | ✗ | 5. | ✓ | 6. | ✓ |
| 7. | ✗ | 8. | ✓ | 9. | ✗ |
| 10. | ✓ | 11. | ✓ | 12. | ✗ |
| 13. | ✓ | 14. | ✗ | 15. | ✓ |
| 16. | ✓ | 17. | ✓ | 18. | ✓ |
| 19. | ✗ | 20. | ✓ | 21. | ✓ |
| 22. | ✗ | 23. | ✓ | 24. | ✗ |
| 25. | ✓ | | | | |

26.

a. 6, 9, 14
b. 4, 8
c. 2, 11
d. 3,
e. 13, 15,
f. 1, 12
g. 5
h. 7, 10

(2)

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | ④ | 2. | ③ | 3. | ② |
| 4. | ③ | 5. | ① | 6. | ② |
| 7. | ④ | 8. | ① | 9. | ③ |
| 10. | ③ | 11. | ③ | 12. | ③ |
| 13. | ③ | 14. | ③ | 15. | ④ |
| 16. | ① | 17. | ③ | 18. | ③ |

(3)

1. පරිසරයේ ඇති ව්‍යාපාර අවස්ථා හඳුනාගෙන අවදානම් දරමින් නිර්මාණශීලීත්වය තුළින් නවෝත්පාදන බිහි කිරීමෙහි යෙදෙන මිනිස් චින්තනය හා සම්බන්ධ වූ ක්‍රියාවලියක් ව්‍යවසායකත්වය ලෙස නිර්වචනය කළ හැකිය.
   පිළිතුර තුළ (ගැටලු හඳුනා ගැනීම ඒවාට විසඳුම් ලෙස භාණ්ඩ හා සේවා නිෂ්පාදනය, යන කරුණු අඩංගු විය හැකිය. ව්‍යාපාර අදහසක් හඳුනාගෙන එය යම් ප්‍රායෝගික ව්‍යාපාර කටයුත්තක් බවට පරිවර්තනය කිරීමේ හැකියාව ද ව්‍යවසායකත්වය නම් වේ.)

2. ව්‍යවසායකත්ව කාර්යයේ යෙදී සිටින පුද්ගලයා ව්‍යවසායකයා නම් වේ.

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

3. භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය තිබූ පමණින් නිෂ්පාදනයක් සිදු නොවන අතර මේවා මනා ලෙස සංකලනය කොට නිවැරදි සැලසුම් අනුව මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලන භාණ්ඩ හා සේවා නිපදවීම සඳහා ව්‍යවසායකත්වය යන නිෂ්පාදන සාධකය අත්‍යවශ්‍යවේ.

4. නිර්මාණශීලීත්වය, නවෝත්පාදන බිහි කිරීම, නිෂ්පාදනය සැලසුම් කිරීම, අවදානම් බාර ගැනීම, පරිසර සංවේදී බව හා අවස්ථා හඳුනා ගැනීම....වැනි

5. භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය

6. නිෂ්පාදන කාර්ය සඳහා යොදා ගන්නා කායික හෝ මානසික ශක්තිය ශ්‍රමය නම් වේ.

7. ගොඩනැගිලි, යන්ත්‍ර සූත්‍ර, උපකරණ ඇතුළු මිනිසා විසින් නිපදවන සියලු දෑ මෙයට අයත් වේ.

8. නිපදවන්නේ කවර භාණ්ඩ හා සේවා ද?

ඒවා කොපමණ ප්‍රමාණයක් නිපදවිය යුතුද?

නිෂ්පාදන සාධක සංයෝග කරන්නේ කෙසේද?

9.

1) නිර්මාණශීලීත්වය
2) නවෝත්පාදන බව
3) අවදානම් බාර ගැනීම
4) අනාගත දැක්ම
5) පරිසර සංවේදී බව හා අවස්ථා හඳුනා ගැනීම
6) සුභවාදී බව
7) ස්වකීය සාර්ථකත්වය තමා අනුව තීරණය වන බව පිළිබඳ විශ්වාසය
8) අසීරු අරමුණු ඉටු කර ගැනීම කෙරෙහි ඇති නැඹුරුව
9) ස්වාධීනත්වය
10) නම්‍යශීලීත්වය

10. ව්‍යවසායකයෙකු ලෙස අනාගතයේ ළඟා කර ගැනීමට අපේක්ෂිත තත්ත්වය ගැන වර්තමානයේ ඔහු තුළ ඇති අදහස හෝ දර්ශනය අනාගත දැක්ම ලෙස හඳුන්වයි.

11. ගැටලු හා අවස්ථා දෙස බලා ඒවාට විසඳුම් ලෙස නව අදහස් සංවර්ධනය කිරීමට හෝ නව මාර්ග සොයා ගැනීමට ඇති හැකියාවයි.

12.

| ගැටළුව | විසඳුම |
|---|---|
| කහ ආනයනය සීමා කිරීම | ගෙවත්තේ කහ වගා කිරීම |
| රසායනික පොහොර භාවිතය සීමා කිරීම | කාබනික පොහොර නිෂ්පාදනයට පෙළඹවීම |
| අලි මිනිස් ගැටුම | වන අලින්ට නිශ්චිත භූමි ප්‍රදේශයක් වෙන් කිරීම |

13.

1) විශ්වාසය හා ආකල්ප කෙරෙහි තදබල ලෙස ගැලී සිටීම
2) යම් ගැටලුවකට එකම විසඳුමක් ඇතැයි සිතීම
3) ක්ෂණික ප්‍රතිඵල අපේක්ෂා කිරීම
4) තර්කානුකූල පදනමක පිහිටා කටයුතු නොකිරීම
5) ප්‍රායෝගික වීමට බාධා ඇතැයි සිතීම
6) රීති හා සම්ප්‍රදාය අනවබෝධයෙන් පිළිපැදීම
7) වැරදීම් හා විවේචන සඳහා ඇති බිය.

14.

- විවිධත්ව ග්‍රහණය කර ගැනීම
- අසාර්ථකත්වය ඉවසීම
- කුතුහලය දිරිමත් කිරීම
- ගැටලු අභියෝග ලෙස දැකීම
- නිර්මාණශීලී පුහුණු අවස්ථා
- නිර්මාණශීලීත්වය අගය කිරීම
- නිර්මාණාත්මක හැසිරීම් ආදර්ශනය කිරීම

15.

a. අසාර්ථකත්වය ඉවසීම
b. නිර්මාණශීලී පුහුණු අවස්ථා
c. නිර්මාණාත්මක හැසිරීම් ආදර්ශනය
d. විශ්වාස හා ආකල්ප කෙරෙහි තදබල ලෙස ගැලී සිටීම
e. ක්ෂණික ප්‍රතිඵල අපේක්ෂා කිරීම

16.

1) නවෝත්පාදනය
2) අවදානම
3) සංකලනය
4) ප්‍රතිලාභය
5) සාමාන්‍ය වැටහීම

17. එකහවේ, ව්‍යවසායකයාගේ නවෝත්පාදනය සාර්ථක හෝ අසාර්ථක වීම පිළිබඳ ඇති අවිනිශ්චිතතාව අවදානමයි. මෙය මූල්‍ය අවදානමකි. තමා යොදවන මුදලට ප්‍රමාණවත් ප්‍රතිලාභයක් ලැබේද යන අවිනිශ්චිතතාවයි.

18. අවදානම ඉහළ නම් ප්‍රතිලාභ ඉහළ වේ.

අවදානම පහළ නම් ප්‍රතිලාභ පහළ වේ.

19.

<u>නව සොයාගැනීමක්</u>

මෝටර් රථය, සබන්, කොරෝනා එන්නත

<u>දිගුවක්</u>

ස්මාර්ට් රූපවාහිනිය, බහු කාර්ය රයිස් කුකරය, විද්‍යුත් ගෙවීම් ක්‍රම, ස්වයං සේවා වෙළෙඳසැල

<u>අනුකරණය කිරීමක්</u>

ජංගම බෙදා හැරීමේ රථ, විවිධ රූපවාහිනී වැඩසටහන්, විවිධ නම්වලින් විවිධ බැංකුවල පවත්වාගෙන යන බැංකු තැන්පතු ක්‍රම

<u>සංකලනයක්</u>

රස කැවිලි, පැණි කජු අයිස් ක්‍රීම්, ඉඟුරු තේ

20.

- පෞද්ගලික ගුවන්යානා භාවිතය
- නිවසට පැමිණ භාණ්ඩ විකිණීම
- අන්තර්ජාලයෙන් භාණ්ඩ ඇණවුම් කිරීම

21. ජෙසිකා කොක්

22.

- කැපවීම
- සාමාන්‍ය වැටහීම
- ස්වයං පෙළඹවීම
- ආත්ම විශ්වාසය
- තොරතුරු සොයා බැලීම
- දැඩි ආශාව

(4)

1. නිර්මාණශීලීත්වය
   නවෝත්පාදනය
   අවදානම් බාර ගැනීම
   අනාගත දැක්ම
   පරිසර සංවේදී බව හා අවස්ථා හඳුනා ගැනීම
   සුභවාදී වීම
   ස්වකීය සාර්ථකත්වය තමා අනුව තීරණය වන බව පිළිබඳ විශ්වාස
   අසීරු අරමුණු ඉටු කරගැනීම කෙරෙහි ඇති නැඹුරුව
   ස්වාධීනත්වය
   නම්‍යශීලීත්වය

2. සංකලනයක් - පොළොස් මාළු සඳහා තුනපහ මිශ්‍රණය
   දිගුවක් - මිරිස් වේලා විකිණීම
   මිරිස් කුඩු පැකට් විකිණීම

3. නිර්මාණශීලී පුහුණු අවස්ථා
   නිර්මාණශීලීත්වය අගය කිරීම
   අසාර්ථකත්ව ඉවසීම
   විවිධත්ව ග්‍රහණය කර ගැනීම

4. තොරතුරු සොයා බැලීම — කැපවීම
   ආත්ම විශ්වාසය — ස්වයං පෙළඹවීම
   දැඩි ආශාව — සාමාන්‍ය වැටහීම

5. ප්‍රදේශයේ කුළුබඩු සපයන ප්‍රමුඛ පෙළේ වෙළෙඳ නාමය බවට පත්වීම. (මෙවැනි ආකාරයේ ඕනෑම යෝජනාවක් විය හැකිය.)